(අන්තර්ජාල අනුවාදයකි.)

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1999 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වැනි දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 3.50** **තැපැල් ගාස්තුව : රු. 3.50**

**1999 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වැනි දින]

එල්.ඩී.—ඕ. 62/98.

**1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1999 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 02 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතේ 6 වන වගන්තිය, ඒ වගන්තියේ (*ආ*) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1979 අංක 02 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(*ආආ*) (i) පදිංචිය සඳහා වූ නිවසක් තැනීමට ඉඩමක් මිල දී ගැනීම හෝ බද්දට ගැනීම සඳහා ;

(ii) පදිංචිය සඳහා වූ නිවසක් තැනීම,අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ කොටසක් එකතු කිරීම සඳහා ;

(iii) පදිංචිය සඳහා වූ නිවසක් මිල දී ගැනීම හෝ බද්දට ගැනීම සඳහා ;

(iv) (i) වන, (ii) වන හෝ (iii) වන අනුඡේදවල සඳහන් කාර්යවලට ආනුෂංගික, අතිරේක හෝ අනුයාත වන ඕනෑම කාර්යයක් සඳහා ; හෝ

(v) (i) වන, (ii) වන, (iii) වන හෝ (iv) වන අනුඡේදවල සඳහන් යම් කාර්යයක් සඳහා දැනටමත් දරා ඇති ණයක් බේරුම් කිරීම සඳහා,

යම් තැනැත්තෙකුට ණය සහ අත්තිකාරම් ලබාදීම.".

H-022545

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි 1 වන උපවගන්තිය ඉවත් කොට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මේ පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවුරුද්දකට යටත් පිරිසෙයින් දහවරක්වත් හා කාර්තුවකට දෙවතාවක්වත් රැස්විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි 3 වන උපවගන්තිය ඉවත් කොට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) බැංකුවේ මුද්‍රාව සාමාන්‍යාධිකාරීවරයා හෝ වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා හෝ සහකාර සාමාන්‍යාධිකාරීවරයා හා එක් අධ්‍යක්ෂවරයකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනාම ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.